## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

### ශාස්ත්‍රවේදී අධ්‍යයන ධාරා උපාධි පරීක්ෂණය (භූගෝල විද්‍යාව) - දෙවන භාගය

### දෙවන සෙමෙස්තර අවසාන පරීක්ෂණය – 2017

## GYG 3264 – නාගරික පරිසරය සහ කළමණාකරණය

**පැ දෙකයි (02)**

යටත් පිරිසෙයින් එක් කොටසකින් <u>එක්</u> ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.

---

<u>1 කොටස</u>

1.

(i). සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරීකරණය ගැටලුවක් වීමට බලපාන හේතු කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 05)

(ii). සැලසුම් සහගත නොවන නාගරික භූමි පරිභෝග වෙනස්වීම් නිසා මතුවන සමාජ සහ පාරිසරික ගැටලු නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

2.

(i). "පාරිසරික උපද්‍රව" අර්ථ දක්වන්න.

(ලකුණු 03)

(ii). නාගරික පාරිසරික උපද්‍රව ඇතිවීමට බලපාන හේතු කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(iii). "නාගරික පාරිසරික උපද්‍රවවලින් වඩා පීඩාවට පත්වන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරිකයින්ය" මෙම අදහස නිශ්චිත උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

3.

(i) ගෝලීය වායු දූෂණයෙහි ස්වභාවය කෙටියෙන් දක්වන්න.

(ලකුණු 04)

(ii) නාගරික වායු දූෂණ ගැටලුවට බලපාන ප්‍රධාන හේතු කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 04)

(iii) නාගරික වායු දූෂණයෙහි ප්‍රතිඵල සංවර්ධනය වෙමින් පවතින රටවල් ඇසුරින් විග්‍රහ කරන්න.

(ලකුණු 12)

11 කොටස

4.

(i). "නාගරික භූමි පරිභෝගය" නිර්වචනය කරන්න.

(ලකුණු 02)

(ii). නාගරික භූමි පරිභෝගයෙහි කැපී පෙනෙන ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 03)

(iii). නාගරික භූමි පරිභෝග රටාව තීරණය කිරීමෙහිලා යටත්විජිතකරණය සිදුකළ බලපෑම නාගරික භූමි පරිභෝග ආදර්ශක ඇසුරින් විමසන්න.

(ලකුණු 15)

5.

(i) "තිරසාර නාගරික සංවර්ධනය" අර්ථ දක්වන්න.

(ලකුණු 05)

(ii) අනාගත පරපුර වෙනුවෙන් පරිසරය ආරක්ෂා කිරීම සඳහා තිරසාර නාගරික සංවර්ධනයෙහි අවශ්‍යතාව උදාහරණ සහිතව විමසන්න.

(ලකුණු 15)

6.

(i) "හරිත නගර (Green city) සංකල්පය" නිර්වචනය කරන්න.

(ලකුණු 03)

(ii) හරිත නගරයක ආර්ථිකමය වැදගත්කම කෙටියෙන් පහදන්න.

(ලකුණු 05)

(iii) හරිත නගරයක් නිර්මාණය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සංවර්ධිත රටවල නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

0000000000